**කුච්චවේලි ප්‍රාදේශීය සභාව**

**-------------------------------**

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

**----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශ**

**--------------**

**1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම**

**-------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2015 සැප්තැම්බර් 15 දින ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මැයි 13 දින ඉදිරිපත් කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 දෙසැම්බර් 18 දින සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරන ලදි.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කුච්චවේලි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්**

**---------------------------------------**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම.**

**-----------------------------------------------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය මූල්‍ය ප්‍රකාශයන් සමඟ ඉදිරිපත් කළයුතු වුවත් එම ප්‍රකාශයන් ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**--------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කර නොතිබුණි.

**1.3.3 ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂය තුළදී සභාව විසින් රු.23,987,664 ක පිරිවැයට මාර්ග සහ පාලම් ඉදිකර මහජන උපයෝජනය සඳහා භාරදී තිබුණු නමුත්, මෙම වටිනාකම මූල්‍ය ප්‍රකාශනයන්හි සභාවේ වත්කම් ලෙස හෙළිදරව් කර තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශයන්හි ස්ථාවර තැන්පතු ලෙස රු.5,640,715 ක් දක්වා තිබුණු නමුත්, මෙම සියළුම මුදල් ආපසු ගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂයක් නොතිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වර්ෂ 32 කට පෙර සේවය හැරගිය සේවකයන් 05 දෙනෙකුගෙන් ලබාගත් එකතුව රු.8,500 ක් වූ ඇප තැන්පත් ආපසු ගෙවීමට හෝ පොත්වලින් ලියා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සේවය හැරගිය හෝ වෙනත් ආයතනයන්ට මාරුවී ගිය සේවකයන් 08 දෙනෙකුගෙන් හිඟහිට තිබූ රු.183,360 ක් වූ කාර්ය මණ්ඩල ණය අයකර ගැනීම සඳහා වර්ෂ 03 සිට 06 දක්වා කාලයක සිට කටයුතු කර නොතිබුණි.

(ඇ) ලැබුණු අත්තිකාරම් ලෙස 2005 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශයන්හි රු.7,591 ක මුදලක් දක්වා තිබුණ නමුත් මෙය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2001 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රු.6,030,026 ක් මේ දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 අවිනිශ්චිත ගිණුම

-------------------

සමාලෝචිත වර්ෂය තුළ අවිනිශ්චිත ගිණුමෙහි දක්වන ලද රු.27,035,150 ක් වූ හර ශේෂය හඳුනාගෙන ඉවත් කිරීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි.

**1.3.6 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

----------------------------------------

මූල්‍ය ප්‍රකාශයන්හි වූ පහත සඳහන් එක් එක් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි | 88,435,189 | හිමිකම් ඔප්පු |
| පිරියත් සහ යන්ත්‍ර සූත්‍ර | 4,153,599 | ස්ථාවර වත්කම් ලේඛනය සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ලී බඩු | 4,299,759 | |
| මෝටර් වාහන | 785,993 | |
| කාර්ය මණ්ඩල ණය සහ ආදායම් ණයගැතියෝ | 23,661,868 | කාල විශ්ලේෂණ සහ විස්තරාත්මක උපලේඛන |
| කලින් ලැබීම් | 5,369,158 | |
| ණයගැතියෝ | 1,763,247 | |
| ආපසු නොගෙවූ තැන්පත් | 22,420,504 | |

**1.3.7 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

-----------------------------------------------------

නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| ------------------------------------- | | ------------------ |
| (අ) ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති - 1988 | | |
| (i) I පරිච්ඡේදයේ 5(XII) වගන්තිය | - | මුදල්, ගබඩා සහ චෙක්පත් අත්සන් කිරීම පරිපාලනමය වශයෙන් නිලධාරීන් තිදෙනෙකුට පවරා තිබුණු නමුත් ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබාගෙන නොතිබුණි. |
| (ii) III පරිච්ඡේදයේ 81 වගන්තිය | - | එක් එක් කාර්තුව අවසානයේදී ඉඩම් අයිතිය වෙනස්වීම් පිළිබඳ මුද්දර ගාස්තු ආපසු ගෙවන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන්ද, වෙනත් ගනුදෙනු පිළිබඳ බදු ආපසු ගෙවන ලෙස මහා භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂවරයාගෙන්ද, දඩ මුදල් ආපසු ගෙවන ලෙස උසාවියේ රෙජිස්ට්‍රාර්වරයාගෙන්ද ඉල්ලීම් කර නොතිබුණි. |
| (iii) X පරිච්ඡේදයේ 193 වගන්තිය | - | තථ්‍ය ආදායම සහ වියදම අයවැය ලේඛනය සමඟ සැසඳීම් ප්‍රකාශයක් සහ විචලනයන් සඳහා හේතු පැහැදිලි කිරීම් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) මුදල් රෙගුලාසි 571(2), (3) | - | 1996 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ෂ 17 ක් මූල්‍ය ප්‍රකාශයන්හි ආදායම් තැන්පතු රු.156,650 ක් දක්වා තිබුණු නමුත් ඒවා හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. |
| (ඇ) පළාත් මූල්‍ය රීති (ප.මූ.රී) | | |
| (i) ප.මූ.රී 230 | - | ප්‍රමාණවත් බැංකු ශේෂයක් පවතින බවට ගෙවීම් නිලධාරියා විසින් සනාථ කිරීමෙන් පසු පමණක් චෙක්පත් ලිවිය යුතු වුවද, මුදල් පොතෙහි බැර ශේෂයන් පැවතියදී පසුගිය වර්ෂ දෙකෙහි චෙක්පත් ලියා තිබුණි. මුදල් පොත අනුව 2014 දෙසැම්බර් 31 දිනට බැංකුවෙහි රු.1,556,565 ක බර ශේෂයක් විය. |

| | | |
|---|---|---|
| (ii) | ප.මූ.රී 237 | මාස 06 කට පෙර සභාව විසින් එකතු වටිනාකම රු.142,024 කට නිකුත් කළ චෙක්පත් 12 ක් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොතිබුණු නමුත් මේ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (iii) | ප.මූ.රී 365.1 | විගණිත දිනය වන 2015 ඔක්තෝබර් 02 දක්වා සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික සමීක්ෂණ මණ්ඩල සමීක්ෂණයන් පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.16,197,286 ක් වූ අතර එයට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.15,328,480 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.868,806 ක වර්ධනයක් දැක්වීමයි.

### 2.2 ආදායම් කළමනාකරණය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තුගත ආදායම සහ තථ්‍ය ආදායම අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | 2014 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් | 60,003 | 10,997 | 5,905 |
| කුලී | 6,210 | 2,438 | 2,931 |
| සේවා සඳහා ගාස්තු | 4,822 | 188 | - |
| අයභාර ප්‍රදාන | 17,112 | 25,104 | 2,431 |
| වෙනත් ආදායම් | 22,524 | 9,244 | 458 |

#### 2.2.2 වරිපනම් බදු

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වූ ඉඩම් සහ ඉදිකරන ලද නිවාස සහ ගොඩනැගිලි සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව වරිපනම් අයකර ගැනීම පිණිස තක්සේරු දෙපාර්තමේන්තුව ලවා වාර්ෂික තක්සේරුව ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 **විදුලි සංදේශ කුළුණු සඳහා ගාස්තු අය කිරීම**

-----------------------------------------------

සභා බල ප්‍රදේශය තුළ ස්ථාපනය කළ විදුලි සංදේශ කුළුණු 12 ක් සඳහා ගාස්තු අය නොකිරීම නිසා සභාවට වාර්ෂිකව රු.36,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව විසින් රු.18,687,391 ක් වූ පිරිවැයකට කඩකාමර 35 කින් යුතු වෙළඳපොල සංකීර්ණයක් ඉදි කොට 2014 ජුනි 18 දින භාරදී තිබුණු නමුත්, ජල සැපයුම සහ විදුලිය නොසැපයීම සහ ඉදිරිපස දොරවල් සවි නොකිරීම නිසා මෙම කඩකාමර මේ දක්වා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. තවද, මධ්‍යම පරිසර අධිකාරියෙන් සහ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පූර්ව අනුමැතිය ලබා නොගෙන පුල්මුඩෙයි කලපුව පුරවා මෙම වෙළඳපොල ගොඩනැගිල්ල ඉදිකර තිබුණි.

(ආ) වෙනත් දෙපාර්තමේන්තු විසින් පරිත්‍යාග කරන ලද මෝටර් වාහන 19 ක් සභාව විසින් වර්ෂ 08 කට වැඩි කාලයක් තිස්සේ ප්‍රයෝජනයට ගෙන තිබුණු නමුත් මෙම වාහනවල අයිතිය සභාව නමට මාරුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2014 වර්ෂය සඳහා වූ සමීක්ෂණ මණ්ඩලය විසින් ගබඩා විෂයයන් 574 ක සහ පුස්තකාල පොත් 1,574 ක ඌනතාවයක් වාර්තා කර තිබුණු නමුත් මේ සම්බන්ධයෙන් සභාව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඈ) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අංක 15/2001 සහ 2001 අගෝස්තු 07 දින සහ අංක 9/2009 සහ 2009 අප්‍රේල් 16 දින දරන චක්‍රලේඛ ප්‍රකාරව සේවකයන්ගේ පැමිණීම සහ පිටවීම සටහන් කිරීම පිණිස වේලා සටහන් යන්ත්‍ර සවිකළ යුතු නමුත් එම යන්ත්‍රසවිකර නොතිබුණි.

(ඉ) පුල්මුඩේ සරණාගත කඳවුරේ රැඳවියන්හට නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය වෙනුවෙන් සුබසාධක සේවාවන් සිදුකිරීම සඳහා දරන ලද රු.2,354,448 ක් වූ වියදම් මේ දක්වා අයකරගෙන නොතිබුණි.

(ඊ) 2006 වර්ෂයේ බැංකුවේ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 05 ක වටිනාකම වූ රු.15,605 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2013 වර්ෂය තුළ ජල සම්පාදන යෝජනා ක්‍රමයක් වෙනුවෙන් සුබසාධක සමිති වෙත ලබාදෙන ලද රු.600,000 ක් වූ අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) 2013 වර්ෂයේදී සභාවේ සභාපතිවරයා වෙත දෙන ලද රු10,000 ක් වූ ගමන් වියදම් අත්තිකාරම් මේ දක්වා අයකරගෙන නොතිබුණි.

3.2 **මානව සම්පත් කළමනාකරණය**

2014 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| කාර්ය මණ්ඩල වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විධායක | 01 | - | 01 | - |
| සහායක | 27 | 19 | 08 | - |
| සුළු සේවක | 36 | 59 | - | 23 |
| වෙනත් | 08 | 14 | - | 06 |

කළමනාකරණ සේවයේ අධි ශ්‍රේණියේ තනතුරක්, ඉකුත් වර්ෂ 08 ක් සඳහාද, සුළු සේවක තනතුරු 04 ක් ඉකුත් වර්ෂ 04 ක් සඳහා ද පුරප්පාඩුව තිබුණු නමුත් එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි.

4. **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

4.1 **අභ්‍යන්තර විගණනය**

සෑම පළාත් පාලන ආයතනයක්ම තම ධාරිතාවයට අනුව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවිය යුතු බවට අංක 03 සහ 2005 නොවැම්බර් 08 දිනැති පළාත් පාලන ප්‍රතිශෝධන චක්‍රලේඛයේ 08 වැනි ඡේදයෙන් පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය කර ඇති නියමය පරිදි ප්‍රකාරව සභාව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් කළමනාකරණය
(ඇ) ස්ථාවර වත්කම් පාලනය
(ඈ) අයවැය පාලනය